මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :LAE/2024/EPS/24 2024.10.21

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2024.10.26**
**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**

**මැතිවරණ ප්‍රචාරක කටයුතු තහනම් කාල සීමාව**

ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම 2024.10.26 දින පැවැත්වෙන අතර ඊට අදාළ ප්‍රචාරක කටයුතු සීමා කිරීමේ කාල සීමාව 2024.10.23 දින මධ්‍යම රාත්‍රී 12.00 න් ආරම්භව 2024.10.26 දින ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව අවසන් වීමට නියමිතය.

ඒ අනුව, 2024.10.23 දින ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමට අදාළව පවත්වන ලද අවසන් දේශපාලන ප්‍රචාරක රැස්වීම්වල වීඩියෝ දර්ශන හා විස්තර 2024.10.24 දිනය තුළ එක් එක් රූපවාහිනී/ ගුවන් විදුලි නාලිකාවේ එක් ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයක පමණක් ප්‍රචාරය කිරීමට හා 2024.09.25 දින පළ කරනු ලබන ප්‍රවෘත්ති පත්‍රවල ඡායාරූප හා රැස්වීම් වාර්තා පළ කිරීමට ක්‍රියා කරන ලෙස දන්වා සිටිමි. මෙම කොන්දේසි එක් එක් නාලිකාවේ හා ප්‍රවෘත්ති පත්‍රවලට අනුබද්ධ සමාජ මාධ්‍ය හා සෙසු සියලුම සමාජ මධ්‍ය වේදිකා පරිපාලකවරුන්ට ද අදාළ වේ. එසේම, මෙම අවසන් ප්‍රචාරක රැස්වීම් විස්තර ප්‍රසිද්ධ කිරීමේ දී සියලුම අපේක්ෂකයන්ට සම අවස්ථා ලැබෙන පරිදි පුවත්පත්වල ඉඩකඩ හා නාලිකාවල විකාශ කාල වෙන් කිරීම කළ යුතු බව ද දන්වා සිටිම.

තවද, 2024.10.24, 25 හා 26 දිනවල සියලුම රූපවාහිනී නාලිකාවල දවසේ පුවත්පත් සිරස්තල ඉදිරිපත් කිරීමේ දී දෛනික පුවත්පත්වල පුවත් සිරස්තල පමණක් ඉදිරිපත් කිරීම කළ යුතු අතර, ප්‍රවෘත්තියට අදාළව වෙනත් කිසිඳු අදහසක්/ යෝජනාවක් හෝ ප්‍රවෘත්තියට පටහැනි අදහසක් එය ඉදිරිපත් කරන මධ්‍යවේදීන් විසින් සිදු නොකළ යුතු අතර කිසිදු දේශපාලන ප්‍රචාරක ප්‍රවෘත්තියක් මගින් පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය හෝ අගතියට පත්වන ආකාරයේ ඉදිරිපත් කිරීමක් සිදු නොකරන ලෙස සියලුම මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය නාලිකා ප්‍රධානීන්, ප්‍රවෘත්ති අංශ ප්‍රධානීන්, ප්‍රවෘත්ති සංස්කාරකවරුන්, කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන කර්තෘවරුන්ගෙන් හා සියලුම සමාජ මාධ්‍ය හිමිකරුවන් වෙත වැඩිදුරටත් නිවේදනය කරමි.

එසේම මෙම ප්‍රචාරක කටයුතු සීමා කිරීමේ කාලසීමාව තුළ දී ඇල්පිටිය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පාර්ලිමේන්තු මැතිවරණය තරග කරනු ලබන පක්ෂ/ අපේක්ෂක/ කණ්ඩායම් විසින් මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදු කිරීමෙන් වළකින මෙන් හා මැතිවරණ නීති බලාත්මක කිරීමට සහය වන මෙන් මැතිවරණ කොමිෂන් සභාව අදාළ සියලු පාර්ශ්ව වෙතින් ඉල්ලා සිටී.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්